# උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය 2013

## 11 කොටස

11 ශ්‍රේණිය                                                   විභාග අංකය :............

සිංහල භාෂාව හා සාහිත්‍යය                    කාලය පැය 2

---

***ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න මෙම ප්‍රශ්ණ පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි**

**1 සිට 10 තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එම අනු අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

i සිංහල අක්ෂර මාලාවේ ශ,ෂ,ෂ,ෆ යන අක්ෂර හතර හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න

ii පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න

**උතුරු නැගෙනහිර පලාත්වල සිසුහු භාසා විෂයයන්ට වැඩි දක්ෂතාවක් දක්වති**

iii පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න

(අ) වප්පිහිය          (ආ) සහසැස්

iv පහත සඳහන් පද දෙක කවර සමාස වලට අයත් දැයි නම් කරන්න

(අ) මව්පිය          (ආ) නිලුපුල්

v විරුද්ධාර්ථ පද එක බැගින් ලියන්න

නිසසල    මුකුලිත

vi කැසටු මිහිරිතම යන තද්ධිත පදයන්හි ඇතුළත් ප්‍රත්‍ය වෙන් කොට ලියන්න

vii පහත සඳහන් කතෘකාරක වාක්‍ය දෙක කර්ම කාරකයට හරවා ලියන්න

(අ) ගුරුවරු ශිෂ්‍යයන් යහමඟ යවති

(ආ) නිලධාරියා සේවකයන් පහ කළේය

viii පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පද අයත්වන ක්‍රියා වර්ගය නම් කරන්න

(අ) දරුවන් විභාගය සමත් **වුවහොත්** දෙමාපියෝ සතුටු වෙති

(ආ) ගුරුතුමී සිසුන් ලවා ගී **කියවයි**

ix පහත සඳහන් වචන වල අර්ථ පැහැදිලි කරන්න

(අ) වාරකත් (ආ) හඳුන්පත

x පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පදයන්හි අර්ථ පැහැදිලි කරන්න

(අ) **සඳ** නැග එද්දී කුමුදු පිපෙයි

(ආ) නැකත් තරු දුටු **සඳ** බමුණා මන්ත්‍රය ජප කළේය

02 පහත දැක්වෙන අ,ආ,ඉ,ඊ යන විස්තර අතුරින් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න ඒ සඳහා යොග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) විවේක කාලය නිසි පරිදි ගත කිරීමට අද කවුරුත් උනන්දු වෙති. විවිධ ක්‍රීඩාවන්හි නිරත වීම, පොත් පත් කියවීම, ගුවන් විදුලියට සවන් දීම, රූපවාහිනිය නැරඹීම හා චාරිකා වල යෙදීම ආදියට ඇතැමුන් යොමුවන්නේ තමාට ලැබෙන විවේකය ගතකිරීමටය. මින් සතුට විනෝදය ලැබෙනවා පමණක් නොව චරිත සංවර්ධනයට ද මහගු පිටුබලයක් ලැබේ.

(ආ) ජාතිභේද දුරලා එක් රටක් වශයෙන් ක්‍රියා කිරීම අද ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය වූවකි. එක් ලී කැබැල්ලක් කඩා දැමීම පහසු එකක් වුවද ලී කැබලි එක් කල මිටියක් කඩා දැමීම එතරම් පහසු නොවේ යැයි කියමනක් ද ඇත. ආර්ථික හා සමාජ සංවර්ධනයට ජාතික සමගිය කාලීන අවශ්‍යතාවයකි.

(ඉ) දැහැමි සමාජයක් ලෙස නම්දරා සිටි අප සමාජය අද සුරාවෙන් සූදුවෙන් හා වංචාවෙන් පිරීඇත කලෙක නගරබදට පමණක් සීමා වී තිබූ මේ අපචාර අද ගම්බදටත් පැතිර ගොස් ඇත මරණය මඟුල උපන්දින උත්සව ප්‍රීති උත්සව හැමට මේවා යොදා ගන්නා තත්වයට ද අද සමාජය පැමිණ ඇත මතින් තොර සමාජයක් කඩිනමින් ගොඩනැගීම කාලීන අවශ්‍යතාවයකි

(ඊ) මිනිස්සු සත්තු ගහකොළ පරිසරයේම කොටස් කරුවෝ වෙති අද පවත්නා දූෂිත පරිසරය මිනිස් සත්ව ශාක වර්ගවල පැවැත්මට අහිතකර වේ විවිධාකාරයෙන් දූෂණයට ලක්ව ඇති පරිසරය ආරක්ෂාකර ගැනීමට ඔබටත් යම් තරමකින් හෝ දායක විය හැකිය එය ඔබ ආරම්භකළ යුත්තේ ඔබේ නිවසින්මය

03 පහත දැක්වෙන ඡේදය වචන 50 60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

පැරණි සිංහල ජනයාගේ විශ්‍රාමයෙන් වැඩි හරිය ගිලගත් වැව් කර්මාන්තය ඔවුන්ගේ විශිෂ්ටතම වික්‍රමයටත් ශක්තියටත් දෙස් කියන්නක් වීම පුදුමයක් නොවේ. වැව් වලට පමණක් දෙවැනි කොට සැළකිය යුතු වෙහෙර විහාර පිළිම ආදිය තැනීමට සිංහලයන්

උනන්දුකරන ලද්දේ පරිසරය නොව බුදුසමය විසිනි. ඒ කර්මාන්තයන් සඳහා ඔවුහු අඩුව හෝ වැඩිය හෝ ඉන්දියාවට ණයගැති වූහ. වැව් කර්මාන්තයෙන් තරම් ඔවුන්ගේ ආදීනත්වය ඒ කර්මාන්තයෙන් නොදැක්වෙන්නේ එහෙයිනි සිංහල සංස්කෘතියෙහි අදීන අංගයක් ලෙස සැළකිය යුතු සමහර ජනකතා දේවකතා සිරිත් හා ඇතැම් උපකරණද උපන්නේ වැව් නිසා යැයි සිතිය හැකිය. අප අතර පැතිර ගොස් තිබෙන ජනකතාවලිනුත් දේව කතාවලිනුත් රාශියක් ඉන්දියාවෙන් සංක්‍රමණය වී මෙරට ස්වරූපයට අනුව වෙනස් වුණු කතා ලෙස සැළකිය හැකිය වැව් කර්මාන්තයත් වැව්වලින් ලත් ජලයෙන් කරන ලද ගොවිතැන් නිසා උපන් ජනකතා හා දේවකතා ප්‍රස්ථාව පිරුළුද අපේ සංස්කෘතියෙහි ආදීනත්වය කියන නිසැක ලකුණුය. මහසෙන් රජු පිළිබඳ දේව කථාවද ගැමුණු රජුගේ යෝධයන් පිළිබඳ ඇතැම් ජනකථා ද උපන්නේ වැවත් වැව් ආශ්‍රයෙන් කරන ලද ගොවිතැන් නිසාය.

ලකුණු 15

04 පහත දැක්වෙන ඡේදය කියවා එයින් අසා ඇති ප්‍රශ්ණ වලට කෙටි උත්තර සපයන්න.

පෘතුග්‍රීසි උවදුරෙන් බේරෙත්ම ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දයන්ගේ පාලන බලයට යටත් විය. අවුරුදු එකසිය පණහක් පමණ පහතරට ආණ්ඩු කළ ඕලන්ද කාරයෝද ශිල්ප ශාස්ත්‍ර දියුණු කිරීමෙහි නිරත නොවූහ. වෙළඳාමෙන් ධනය සම්භකිරීම ඔවුන්ගේ එකම අභිලාශය විය. මේ සමයෙහි සවාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත් වල පැවති නමුත් දකුණු ඉංදියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළහ. කැඩී බිඳී යන පැරණි රදළ ක්‍රමයකින් යුක්ත වූ උඩරට සිංහල සමාජය අතර මනුෂ්‍ය ශිෂ්ඨාචාරයේ උසස් අංග විද්‍යාමාන නොවීය. සිංහල හෝ දමිළ යම්තම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමක් හැර අන් කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට නොතිබුණේය. අවුරුදු තුන්සීයකට පෙර සටන් පිරිහෙමින් පැවති චිත්‍ර ශිල්පයත් සංගීතයත් මේ කාලයේ දී සිංහලයන් අතුරින් සම්පූර්ණයෙන් බැහැරගොස් තිබුණු බව පෙනෙන්නට ඇත්තේය. ආගමික කෘත්‍යයන්ටද යාගහෝමාදියටද අවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රක්ෂාවක් කොටගත් ඇතැම් කුලවල මිනිස්සු නාට්‍ය ශිල්පය ආරක්ෂා කළහ ලංකාවේ පැරණි කලාවන් අතුරින් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර ශේෂව පැවතුනේ මේ නිසාය.

1 සිංහලයන්ගේ කලාවන් පිරිහීමට පටන් ගත්තේ මීට අවුරුදු කීයකට පෙර ද?

2 පහත රට ඕලන්ද බලය පැවතියේ වර්ෂ කීයක් ද?

3 ඕලන්දයන්ගේ අදහස වූයේ කුමක් ද?

4 නාට්‍ය ශිල්පය පමණක් ඉතිරි වූයේ කවර හෙයින් ද?

5 **අභිලාශය ,ස්වාධීන** යන පද දෙකෙහි තේරුම ලියන්න?

5 වව්නියාව මහරෝහලේ ගිණුම් ලිපිකරු තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ ඒ සඳහා සුදුසු ආකෘති පත්‍රයක් සකස් කරන්න

සුදුසුකම් : අ.පො.ස (සා:පෙළ) ගණිතය, ඉංග්‍රීසි, විෂයන්ට සම්මාන සහිතව විෂයන් 6 කින් සමත්වීම

*පරිගණක භාවිතය පිළිබඳ හැකියාව වසර දෙකක පළපුරුද්ද

*ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

*2014.01.01 දිනට වයස අවුරුදු 22-30 අතර වීම

*වෙනත් සුදුසුකම්

**නැතහොත්**

පහත දැක්වෙන්නේ කිසියම් වෙළඳ දැන්වීමකින් උපුටාගත් කොටස් කීපයකි.

* ජනවාරි පළමුවන දින සිට මාර්තු 31 දින දක්වා 20% වට්ටම් සහිතව පොත් හා ලිපි ද්‍රව්‍ය ලබාගත හැකිය

* සතියේ දිනවල පෙ:ව 8.00 සිට රාත්‍රී 8.00 දක්වා ද සෙනසුරාදා දිනවල ප:ව 1.00 දක්වාද පොත් සාප්පුව විවෘතව තබන අතර පොහෝ දින හා විශේෂ නිවාඩු දින වල වසා ඇත

* සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි සංස්කෘති ආදි විවිධ භාෂාවලින් පළ කළ පොත් හා පැරණි වෛද්‍ය ජ්‍යොතිෂ නක්ෂත්‍ර හා සාහිත්‍ය පොත් ඇත.

විස්තර දැනගැනීම සඳහා පොත් මිල දර්ශනය ලබාගන්න.

ඉහත තොරතුරු ඇසුරු කරගෙන වව්නියාව මඩුකන්ද පාරේ "දැනුම පොත් හල"

2013 ජනවාරි 01 වැනි දින සිට තම ප්‍රචාරක කටයුතු සඳහා පිළියෙල කළ දැන්වීම වචන 100 ක් පමණ ලියන්න.

(ලකුණු 15)